# |----ගිවිසුම----|

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් අවුරුදු 60 ට වැඩි අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙනුවෙන් දිරිය පියස නිවාස යෝජනා ක්‍රමය යටතේ වැඩිහිටියන්ගේ සුභ සාධනය සඳහා වන ජාතික අරමුදල මඟින් ප්‍රදානය කරනු ලබන ___________________ මුදලට අදාලව එළඹෙනු ලබන ගිවිසුමයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙවන මහළ, ඩී කොටස, සෙත්සිරිපාය, දෙවන අදියර, බත්තරමුල්ල ස්ථාපිත ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙනුවෙන් පළමු පාර්ශවය වෙනුවෙන් ___________________ ප්‍රාදේශීය ලේකම් පළමු පාර්ශවකරු වශයෙන් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ____________________ වැඩිහිටි හැඳුනුම්පත හෝ ජාතික හැඳුනුම්පත් අංක දරණ ________________________ දෙවන පාර්ශවය ලෙසද පහත සඳහන් කොන්දේසි වලට යටත්ව 20___ ________මස_____ දින ගිවිසුමට එළඹෙන ලදී.

මෙහි දෙවන පාර්ශවය ලෙස හඳුන්වනු ලබන යන අයට ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් රු.___________________ ප්‍රදානයක් ලබා දීමට පළවන පාර්ශවය විසින් කටයුතු කරනු ලැබේ.

දෙවන පාර්ශවයට අංක _______________ දරණ ඔප්පුව මඟින් හිමි වී ඇති නිශ්චල දේපල තුළ ඉදිකර ඇති නිවස අළුත්වැඩියා කිරීම හෝ නිවස ඉදි කිරීම සඳහා ඉහත මුදල භාවිත කිරීමට එකඟ වේ.

පළමු පාර්ශවය විසින් ලබා දුන් ලබන ඉහත ප්‍රදානය නිවාසයේ අළුත් වැඩියා කිරීම හෝ නිවාස ඉදිකිරීම සඳහා පමණක් වැය කරනු ලබන බවත් වෙනත් කිසිදු කටයුත්තකට එම මුදල වැය නොකරන බවට දෙවන පාර්ශවය එකඟ වේ.

දෙවන පාර්ශවය විසින් නිවස අළුත්වැඩියා කිරීම හෝ නිවාස ඉදි කිරීම කරනු ලබන ප්‍රමාණය අනුව මුදල් නිදහස් කිරීමට පළමු පාර්ශවය කටයුතු කරනු ලබන අතර අවශ්‍ය ඕනෑම මොහොතක නිවස අළුත්වැඩියා කිරීම හෝ නිවස ඉදිකිරීමේ කටයුතු නිසි පරිදි සිදු වනවාද යන්න පරික්ෂා කිරීමට පළමු පාර්ශවය හෝ එහි නියෝජිතයන්ට අවස්ථාව ලබා දීමට දෙවන පාර්ශවය එකඟ වේ.

මාස තුනක කාලයක් තුළ නිවස අළුත්වැඩියා කිරීම සහ නිවාස ඉදි කිරීමේ කටයුතු සිදු කර අවසන් වූ පසු අවම වශයෙන් වසර 05 ක කාලයක් එම නිවසේ භුක්තිව සිටීමට දෙවන පාර්ශවය එකඟ වේ.

ඉහත සඳහන් වසර 05 ක කාලයට පෙර එකී දේපල පැවරීමක්, විකිණීමක්, විනාශ කිරීමක් හෝ අලාභහානි සිදු කිරීමක් සම්බන්ධව චෝදනාවක් දෙවන පාර්ශවයට එරෙහිව එල්ලවුව හොත් ඒ පිළිබඳ පළමු පාර්ශවය විසින් සිදු කරනු ලබන ආයතන පරීක්ෂණයකින් දෙවන පාර්ශවය වරදකරු වුවහොත් පළමු පාර්ශවය විසින් ලබා දී ඇති මුළු ප්‍රදානය නැවත ගෙවීමට දෙවන පාර්ශවය එකඟ වේ.

ප්‍රාදේශීය ලේකම්

අත්සන (නිල මුද්‍රාව)

දෙවන පාර්ශවය

නම

අත්සන

පළමු සාක්ෂිකරු

(පළමු පාර්ශවය වෙනුවෙන්)

නම

තනතුර

පළමු සාක්ෂිකරු

(දෙවන පාර්ශවය වෙනුවෙන්)

නම

තනතුර